චක්‍රලේඛ අංක - 05/2015

මගේ අංකය - CSD/03/03/14
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපල පාර
බම්බලපිටිය.
2015-08- ( )

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියලුම අංශ භාර නිලධාරීන්,
සියලුම බලකා භාර අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,
ශ්‍රී ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත.

<u>බලකා මූලස්ථාන/ පුහුණු පාසල් වලින් පිටත විශේෂ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක සාමාජිකයින් මාසික වැටුප ලබාගත් බවට සහතික කිරීම</u>

සියලුම සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහාම සෑම මාසයකම 25 දින බැංකු ගිණුම් මගින් වැටුප් ගෙවීමට මේ වන විට කටයුතු කරන අතර ඔවුන් විසින් තම වැටුප ලද බවට බලකා මූලස්ථානයට/පුහුණු පාසලට ලබා දෙන වැටුප් ලේඛනයේ අත්සන් තබා සහතික කළ යුතුය. නමුත් විශේෂ රාජකාරි සඳහා බලකා මූලස්ථානයෙන්/පුහුණු පාසලෙන් පිටතට අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා වැටුප් ලේඛනයේ අත්සන් තැබීම නියමිත දිනට සිදු කිරීමට නොහැකි වන බැවින් ඒ සඳහා විශේෂ ආකෘතියක් හඳුන්වාදීමට තීරණය කර ඇත.

02. ඒ අනුව ඔබ බලකා මූලස්ථානය/ පුහුණු පාසල මගින් විශේෂ රාජකාරී සඳහා පිටතට අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක සාමාජිකයින් විසින් අදාල මාසයේ වැටුප එම මස 25 දින ලබාගත් බවට සනාථ කිරීම සඳහා මේ සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කොට එළඹෙන මාසයේ 10 වන දිනට පෙර තම අධීක්ෂණ නිලධාරියා මගින් සහකාර අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) වෙත ලැබීමට සැලැස්විය යුතු වේ.

03. මේ පිළිබඳව අදාල සියලු සිවිල් ආරක්ෂක සාමාජිකයින් දැනුවත් කිරීමට ඔබ විසින් කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

## වැටුප ලද බවට සහතිකය

නම - ..............................................................

තනතුර සහ නිල අංකය - ..............................................................

අනුයුක්ත බලකාය/

පුහුණු පාසල - ..............................................................

දැනට අනුයුක්ත රාජකාරි ස්ථානය - ..............................................................

වැටුප බැරවන බැංකු ගිණුම් අංකය - ..............................................................

මා .............. වර්ෂයේ ...................................... මාසයට හිමි වැටුප වන රු. ................................ ක් ඉහත බැංකු ගිණුමෙන් නිවැරදිව ලද බව සහතික කරමි.

........................................ ............................

අත්සන (දිනය)